(අටවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

අංක 2(2).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2018 සැප්තැම්බර් 21 වැනි සිකුරාදා**

---

## 2018 ඔක්තෝබර් 09 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 31 දිනැති අංක 2073/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.09.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූනි 08 දිනැති අංක 2074/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.09.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 3),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූනි 14 දිනැති අංක 2075/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.09.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 දරන හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3) වගන්තිය සහ 14 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ ආනයන හා අපනයන (පාලන) නියෝග සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අගෝස්තු 10 දිනැති අංක 2083/37 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.09.18 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

## 2018 නොවැම්බර් 07 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

26/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් මහනුවර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් සංවර්ධන ව්‍යාපෘතියේ නම, වැයකරන ලද මුදල, කොන්ත්‍රාත් ලබාදුන් සමාගමේ නම, එම සමාගමට ලබාදුන් මුදල සහ විවෘත කිරීමට වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අමාත්‍යාංශය විසින් මහනුවර දිස්ත්‍රික්කය තුළ ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

55/'18

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 206ට අනුව, 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම පනත මඟින් අපහසුතාවයට පත් කරන ලද ආයෝජකයන්ගේ සහ ව්‍යාපාරවල නාමලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(ii) 2011 අංක 43 දරන පනත මඟින් අපහසුතාවයන්ට පත් වූ ව්‍යාපාරවලට සහන ලබාදීමට හෝ පහසුකම් ලබාදීමට රජය විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග කවරේද;

(iii) උක්ත අයවැය යෝජනාව අනුව, දේශීය හා ගෝලීය ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ හෝ ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන නව නීති රීති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

140/'18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල සිට දඹුල්ල දක්වා ඉදිවෙන මධ්‍යම අධිවේගී මාර්ගය හේතුවෙන් දඹුල්ල ප්‍රදේශයේ ඉඩම් අහිමි වන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුද්ගලයන්ගේ නම් කවරේද;

(iii) එම පුද්ගලයන්ට වන්දි ලබා දීමේ බරපතල ගැටලු මතු වී තිබෙන බව දන්නේද;

(iv) එසේ නම්, එම ගැටලු විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

171/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පැලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය විවෘත කළ දිනය කවරේද;

(ii) එම වෙළඳ සංකීර්ණයේ රථගාල විවෘත කළ දිනයේ සිට එමගින් ලංකා ධීවර සංස්ථාව වාර්ෂිකව ලැබූ ආදායම කොපමණද;

(iii) එම රථගාලේ ආදායමෙන් කොටසක් පෞද්ගලික සමාගමක් වෙත හිමි වන්නේද;

(iv) එසේ නම්, එම මුදල වාර්ෂිකව කොපමණද;

(v) එම මුදල එකතු කිරීම ඉහත පෞද්ගලික සමාගමට ලබා දී ඇත්තේ ටෙන්ඩර් ක්‍රමවේදයක් අනුවද;

(vi) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද අනෙක් සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

208/'18

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014, 2015 සහ 2016 යන වර්ෂවලදී රාජ්‍ය ණය ප්‍රමාණය, දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(ii) 2014, 2015 සහ 2016 යන වර්ෂවලදී ඒක පුද්ගල රාජ්‍ය ණය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

253/'18

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බලශක්ති කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්ය සාධන බලකාය පිහිටුවනු ලැබූ නීතිමය පදනම කවරේද;

(ii) එම ආයතනය ආරම්භ කිරීමෙන් පසු ඉටු කරන ලද ප්‍රධාන කාර්යය කවරේද;

(iii) එම ආයතනය වෙනුවෙන් කරන ලද ආයෝජනයට සාපේක්ෂව, ප්‍රතිඵලයක් නොලැබී ඇති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

434/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැකිරාව නගරයේ පිහිටා ඇති බස් නැවතුම්පොළ 1977 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රමානුකූලව අලුත්වැඩියා කර නොමැති බැවින්, ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බවත්;

(ii) මේ හේතුවෙන් මගීන් මහත් හිරිහැරයට ලක් වන අතර බස් නැවතුම්පොළෙහි බස් හැසිරවීමද ඉතාමත් අසීරු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම බස් නැවතුම්පොළ ඉදිරියේදී ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද;
(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

460/'18

ගරු බිමල් රත්නායක මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

489/'18

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය සපයා ඇති දූපත් සංඛ්‍යාව කොපමණද;
(ii) එම එක් එක් දූපතෙහි සිටින විදුලි පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;
(iii) එම දූපත්වල බිල්පත් අය කර ගැනීමේ කාර්යක්ෂමතාව කොපමණද;
(iv) එකී දූපත් සඳහා ඩීසල් විදුලිබලාගාර වෙනුවට සූර්ය විදුලි බලය සහ සුළං විදුලි බලය භාවිතා කිරීමේ හැකියාවක් තිබේද;
(v) එසේ නම්, එම බලශක්තිය භාවිතා කරනු ලබන දූපත් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

502/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ පාසල් අතරින් තාක්ෂණික විද්‍යාගාර පහසුකම් ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;
(ii) එම පාසල්වල නම් කවරේද;
(iii) බදුල්ල දිස්ත්‍රික්කයේ සිසුන්ගේ තාක්ෂණික දැනුම වැඩි කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

535/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිවිධ හමුදාව සඳහා පුද්ගලයන් බඳවාගැනීමේදී, ආධුනික අපේක්ෂකයාගේ කල්ක්‍රියාව, චරිතය හා අධ්‍යාපන සුදුසුකම් ඉතා උසස් තත්ත්වයෙන් තිබුනද, පියාට අනවසර මත්පැන් චෝදනා තිබීම හෝ දඩ ගැසීම් සිදු කර තිබීම හේතුවෙන්, ආධුනික අපේක්ෂකයාගේ බඳවාගැනීම අහෝසිවී යන බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම නීතිය ඉවත් කරලීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

560/'18

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ඇති මුස්ලිම් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම දිස්ත්‍රික්කයේ දැනට සිටින මෞලවි ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iv) මෞලවි ගුරු හිඟය පියවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

581/'18

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2014 දක්වා සහ 2017 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාව බුලත් අපනයනය මඟින් ඉපැයූ ආදායම කොපමණද;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ බුලත් වගාවේ නියුතු පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) අපගේ ප්‍රධාන බුලත් ගැණුම්කරුවා වන පකිස්ථානය බුලත් සඳහා අධික බද්දක් පැනවීම හේතුවෙන් මේ වනවිට ගොවීන්ට බුලත් විකුණා ගැනීමට නොහැකි තත්ත්වයක් පවතින බව දන්නේද;

(iv) මේ සඳහා මැදිහත්වී බුලත් වගාකරන්නන්ගේ ජීවන මට්ටම උසස් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

964/'18

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 - I ශ්‍රේණියට උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා 2017 වර්ෂයේ විභාගය පැවති දිනය කවරේද;

(ii) ජාතික පාසල්වල පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් පැවති මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවති බව පිළිගන්නේද;

(iii) එමනිසා, විභාග අපේක්ෂකයන්ට ඉහත ඕනෑම භාෂාවකින් පිළිතුරු සැපයිය හැකි වූ බව පිළිගන්නේද;

(iv) ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා සිංහල භාෂාවෙන් පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ට තේරී පත්වීමට අවස්ථාවක් ලබා නොදී තිබේද;

(v) එසේ නම්, සිංහල මාධ්‍ය ප්‍රශ්න පත්‍රයටද ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය යුතුයැයි අදාළ විභාගය සඳහා අයදුම්පත් කැඳවූ ගැසට් පත්‍රයේ හෝ වෙනත් ආකාරයකින් පූර්ව දැනුම්දීමක් කර තිබුණේද;

(vi) ඉංග්‍රීසි ගුරු පුරප්පාඩු සඳහා සිංහල මාධ්‍යයෙන් පිළිතුරු සැපයීම නුසුදුසුකමක් වන්නේ යැයි පූර්ව දැනුම්දීමක් කර නොතිබියදී, සිංහල මාධ්‍යයෙන් පිළිතුරු සැපයූ අපේක්ෂකයන් තෝරා නොගැනීමෙන් අසාධාරණයක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

988/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එම කොට්ඨාසය තුළ කැණීම් නොකරන ලද එහෙත්, හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන පිහිටා තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) ඉහත කොට්ඨාසයේ පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත රජමහා විහාර සංඛ්‍යාව කොපමණද; ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත පුරාවිද්‍යාත්මක ස්ථානවල සංරක්ෂණ කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 නොවැම්බර් 08 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

15/'18

ගරු කනක හේරත් මහතා,— සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වෙසෙන වැඩිහිටි (අවු. 60 ඉක්ම වූ) ජනතාව සඳහා රජය විසින් සලසන සුබසාධන පහසුකම් කවරේද;

(ii) 2001 සහ 2011 වර්ෂවලදී ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහන ප්‍රතිශතය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iii) පුරෝකථනයන්ට අනුව 2021 වර්ෂය වනවිට එම ප්‍රතිශතය කොපමණ විය හැකිද;

(iv) ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහන ප්‍රතිශතය වාර්ෂිකව සීඝ්‍රයෙන් ඉහළ යන බව දන්නේද;

(v) එසේ නම්, ඉහළ යන මෙම වැඩිහිටි ජනගහනයේ සුරක්ෂිතතාවය සහ සුබසාධනය සඳහා යම් වැඩපිළිවෙළක් දියත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වැඩිහිටියන් සඳහා ලබාදෙනු ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසි හැඳුනුම්පතෙන් රජය බලාපොරොත්තු වන සහන ඉටු වන්නේද;

(ii) ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ස්ථාවර තැන්පතු සඳහා අය කරනු ලබන බද්දෙන් ඔවුන් නිදහස් කිරීම සඳහා ඔබ අමාත්‍යාංශය මැදිහත් වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාවේ තිබෙන වැඩිහිටි නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැඩිහිටි නිවාසවල ප්‍රමිතිය සලකා බැලීම සඳහා යොදා ගනු ලබන නිර්ණායක කවරේද;

යන්නත් එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

19/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කය තුළ ඇති ක්‍රීඩාපිටි සංඛ්‍යාව කොපමණද;

(ii) එම ක්‍රීඩාපිටිවල නම් කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා එම ක්‍රීඩාපිටි අතරින් සංවර්ධනය කරනු ලැබූ ක්‍රීඩාපිටි සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) එම ක්‍රීඩාපිටි සංවර්ධනය සඳහා වැය කරනු ලැබූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත් ලබාගත් පුද්ගලයන්ගේ හා ආයතනවල නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(vi) මහනුවර දිස්ත්‍රික්කයේ සෙසු ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

37/'18

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2016 අයවැයෙහි අංක 174 යෝජනාවට අනුව, ජාතික පාරිසරික සංරක්ෂණ වැඩසටහන යටතේ අමතර වැඩසටහන් සඳහා වෙන්කළ රුපියල් මිලියන 2000ක ප්‍රතිපාදන 2016 වර්ෂය තුළදී වැයකළ ආකාරය පැහැදිලි කරන්නේද;

(ii) උක්ත යෝජනාව අනුව මූල්‍ය ප්‍රතිපාදන ලබා දුන් "අමතර වැඩසටහන්" කවරේද;

(iii) මෙම අමතර වැඩසටහන් සඳහා වගකීම දරන ලද ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත අයවැය යෝජනාවට අනුව, 2016 වර්ෂය තුළදී,

(i) පාරිසරික සමතුලිත බව ආරක්ෂා කිරීම;

(ii) තිරසර ඉඩම් කළමනාකරණය;

(iii) ජීව සම්පත් සංරක්ෂණය;

(iv) පරිසර දූෂණය පාලනය;

(v) වන සම්පත ආරක්ෂා කිරීම;

සඳහා වැය කර ලද මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

158/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2015.01.08 දින සිට මේ දක්වා කැබිනට් අමාත්‍යවරයන්, රාජ්‍ය අමාත්‍යවරයන් හා නියෝජ්‍ය අමාත්‍යවරයන් සඳහා වාහන මිලදී ගත් අවස්ථා කවරේද;

(ii) එක් එක් වාහනයේ වර්ගය හා මිල කවරේද;

(iii) එම වාහන සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

191/'18

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පසුගිය රජය කාලයේ ත්‍රිකුණාමලය - මඩකලපුව, A15 මාර්ගය ප්‍රතිසංස්කරණය කරන ලද බවත්;

(ii) මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේදී උප්පාරු ප්‍රදේශයට යාබදව පිහිටි මුරින්ජාරු ප්‍රදේශයේ ඉදිකළ යුතුව තිබූ බෝක්කුව ඉදි නොකළ බවත්;

(iii) එම නිසා, ගංවතුර බැස යාමට නොහැකිව කින්නියා ප්‍රදේශය ගංවතුරෙන් යටවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ස්ථානයේ බෝක්කුවක් ඉදිකිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, බෝක්කුව ඉදිකිරීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

194/'18

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්ෂ 2010 සිට 2015 දක්වා වූ කාල පරිච්ඡේදයේදී, සීමාසහිත ලංකා රෝහලේ කොටස් හිමියෙකු ලෙස ගෝඨාභය රාජපක්ෂ මහතා කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම කාල පරිච්ඡේදය තුළදී සීමාසහිත ලංකා රෝහලේ සභාපති ලෙස ඒ මහතා ලබාගත් වැටුප් සහ දීමනා කවරේද;

(iii) වර්ෂ 2010 සිට 2015 දක්වා කාලය තුළ සීමාසහිත ලංකා රෝහල වාර්තා කළ වාර්ෂික ලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

223/'18

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010 වර්ෂයේදී වවුනියාව, නෙඩුන්කර්ණි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාන්කුලම් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි, පුදුවිලාන්කුලම්, පුට්කුලම්, කුංජුකුලම්, මන්නකුලම් සහ කොල්ලර් පුලියන්කුලම් යන ගම්මාන 05ක පවුල් 270ක් පමණ නැවත පදිංචි කරන ලද බවත්;

(ii) මෙම ගම්මාන මුලතිව් සහ වවුනියාව යන දිස්ත්‍රික්කවලට මායිම්ව පවතින බවත්;

(iii) නැවත පදිංචි කරන ලද කාලයේ සිට මේ දක්වා මෙම ජනතාවට කිසිදු මූලික පහසුකම් හෝ නොමැතිව දැඩි පීඩාවන්ට මුහුණ පා සිටින බවත්;

(iv) A - 9 මාර්ගයට පැමිණීම සඳහා ප්‍රවේශ මාර්ග නොමැති වීම සහ ගම්මාන හරහා තිබෙන දුම්රිය මාර්ගයට හරස්ව වැටී ඇති පාරවල් සඳහා ආරක්ෂාකාරි දුම්රිය ගේට්ටු නොමැති වීමෙන් මෙම ජනතාව විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ පා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ගම්මානවලට අවශ්‍ය මූලික පහසුකම් ලබා දීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පහසුකම් ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

240/'18

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කය සඳහා අනුමත, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ හා ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට ඉහත සේවාවල සේවයේ නියුතු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රත්නපුර දිස්ත්‍රික්කයේ ඉහත එක් එක් සේවාවේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

398/'18

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ කුරුඳු වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ වාර්ෂික කුරුඳු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් කොපමණද;

(iii) ලෝක කුරුඳු අවශ්‍යතාවයෙන් කොපමණ ප්‍රතිශතයක් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන්නේද;

(iv) කුරුඳු අපනයනයෙන් ලැබෙන වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා අලුතින් වගාකර ඇති කුරුඳු වගා අක්කර ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කුරුඳු වගා බිම් ප්‍රමාණය ක්‍රමානුකූලව අඩුවී තිබේද;

(iii) එසේ වගාබිම් ප්‍රමාණය අඩුවී ඇත්නම්, එයට බලපා ඇති හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

432/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව නගර සීමාවේ පිහිටා ඇති නගර සභා ගොඩනැගිල්ලට පිටුපස ඇති ප්‍රදේශයේ පවුල් විශාල සංඛ්‍යාවක් ජීවත් වන බවත්;

(ii) ඔවුන් නිසි ප්‍රමිතියකින් තොර පැල්පත් සහ නිවාස ඉදිකර ඒවායේ පදිංචි වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නගර සංවර්ධනයෙහිලා වැදගත් වන නගර සීමාවේ පිහිටා ඇති මෙම කොටස නිසි පිළිවෙළකට සකස් කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

458/'18

ගරු බිමල් රත්නායක මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2004.12.26 දින ඇති වූ සුනාමි විපතට මුහුණ දුන් හම්බන්තොට නගර සහා නිවාස පාරේ අංක 3/19 දරන නිවසේ පදිංචිව සිටි ටී. එන්. අමීර් මහතා ඇතුළු 68 දෙනෙකුගේ ඉඩම් 2010.03.17 දින වෙරළ උද්‍යානයක් ඉදිකිරීම සඳහා පවරාගත් බවත්;

(ii) පවරාගත් ඉඩම් සඳහා ඉහත සඳහන් පිරිසට මෙතෙක් වන්දි ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පිරිසට වන්දි ගෙවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

472/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඌව පළාත් සභාව තුළ සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින අක්‍රමිකතා සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් අංක SIN/B/AG/KI/2017/02 හා 2017.04.20 දිනැති විමර්ශන වාර්තාවක් ඌව පළාත් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති අතර එම වාර්තාවේ ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පාසල් බෑග් ලබාදීම සම්බන්ධව අනාවරණය කර ඇති ඡේද අංක 4 (ආ) (i) සිට (vii) දක්වා කරුණු ඉදිරිපත් කරන්නේද;

(ii) එම අනාවරණයන්ට අදාළව (ආ) (i) සිට (v) දක්වා සිදු කර ඇති නිරීක්ෂණ ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

481/'18

ගරු ඩී. වී. චානක මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හම්බන්තොට වරාය පෞද්ගලිකරණය කිරීමේ ගිවිසුම මඟින් ලබාදෙන ඉඩම් ප්‍රමාණය සහ ඒවා ලබාදෙන පදනම කවරේද;

(ii) මෙම ගිවිසුම මඟින් මෙහෙයුම් පර්යන්ත සඳහා ලබාදෙන ඉඩම් සඳහා බදු කුලියක් අය කරන්නේද;

(iii) මෙම වරායේ තෙවැනි සහ සිව්වැනි අදියර ඉදිකිරීමේ අයිතිය ගිවිසුම්ගත සමාගම් දෙකෙන් එකකට ලබා දෙන්නේද;

(iv) එසේ නම්, ඒවා ලබාදෙන පදනම කවරේද;

(v) හම්බන්තොට වරායේ දෙවැනි අදියරේදී, ඉදිකරන ලද අක්කර 110ක විශාල දූපත මෙම සමාගම් දෙකෙන් එකකට ලබා දෙන්නේද;

(vi) එසේ නම්, එය ලබාදෙන පදනම කවරේද;

(vii) මේ සඳහා දේශීය හෝ ජාත්‍යන්තර සමාගමක් මඟින් තක්සේරුවක් ලබාගෙන තිබේද;

(viii) නොඑසේ නම්, එම වටිනාකම නිර්ණය කරන ලද පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

524/'18

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් "සහභාගිත්ව සංවර්ධන වැඩසටහන්" යටතේ 2015 වර්ෂයේ සිට මේ දක්වා නිලධාරීන් බඳවාගෙන තිබේද;

(ii) එසේ නම්, එම නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිලධාරීන් සඳහා මාසික වැටුපක් හෝ දීමනාවක් ගෙවන්නේ නම්, ඒ කොපමණද;

(iv) එසේ බඳවාගත් එක් එක් නිලධාරියාගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, අයත් වන ග්‍රාම නිලධාරී වසම හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යන තොරතුරු අඩංගු ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(vi) එම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත ඵලදායී ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

532/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජීවත්වීමට නිවසක් නොමැතිව, තැනින් තැන යමින්, අගුපිල්වල රාත්‍රී කාලය ගත කරන දුගී ජනතාවට, වැසි හා සුළං දිනවල ඉතා ශෝචනීය තත්ත්වයන්ට මුහුණදීමට සිදු වන බව පිළිගන්නේද;

(ii) කොළඹ නගරයේ සහ අනිකුත් ප්‍රධාන නගරවල මෙබඳු අසරණ දුගී ජනතාවට ආවරණයක් ලබාදීමට පළාත් පාලන ආයතන හරහා තාවකාලික නවාතැන් පොළ හෙවත් "අම්බලම්" ඉදිකර දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 නොවැම්බර් 09 වැනි සිකුරාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

54/'18

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 161ට අනුව, තේ සහ රබර් කර්මාන්තය උනන්දු කරවීම සඳහා, එකී වගාවන්හි නියුතු සමාගම්වලට වසර දෙකක බදු නිදහස් කිරීමක් ලබා දී තිබේද;

(ii) උක්ත යෝජනාවට අනුව, එකී බදු නිදහස ලබා ගත් සමාගම් ලැයිස්තුව ඉදිරිපත් කරන්නේද;

(iii) උක්ත බදු නිදහස ලබා දීමෙන් රජයට අහිමි වූ බදු ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

148/'18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය පළාත් පාලන මැතිවරණයෙන් පසුව එකම පාසලක අවුරුදු 8කට වඩා සේවය කළ ගුරුවරුන් මාරු කිරීමට නියමිතව තිබූ බවත්;

(ii) එසේ වුවද, ගලේවල අධ්‍යාපන කලාපය තුළ මෙම තීරණය තවමත් ක්‍රියාත්මකකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, ගලේවල අධ්‍යාපන කලාපයේ එම තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

170/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අංක 27/88 හා අංක 01/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව රාජ්‍ය සේවයේ හා රාජ්‍ය සංස්ථාවන්හි පුරප්පාඩු පිරවීමේ දී, ඉන් 3%ක ප්‍රතිශතයක් සුදුසුකම් ලත් හා ආබාධිත තත්ත්වය ඔවුන්ගේ කටයුතුවලට බාධාවක් නොවන ආබාධිත පුද්ගලයන්ගෙන් පිරවිය යුතු බවත්;

(ii) ශ්‍රී ලංකා පරිපාලන සේවයට නිලධාරින් බඳවා ගැනීමේ 2004 (2005) විවෘත තරඟ විභාගයට විභාග අංක 0087548 යටතේ පෙනී සිට ලකුණු 135 ක් ලබා සමත්ව සිටින 1 1/4 කණුව, අම්පාර පාර, සියඹලාණ්ඩුව යන ලිපිනයේ පදිංචි කායික ආබාධ සහිත තැනැත්තෙකු වන ඩබ්ලිව්. එල්. ආර්. එන්. ලියනගේ මහතා, තමා ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමට සළකා බලන ලෙසට කර ඇති අභියාචනය, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ආබාධ සහිත පුද්ගලයන් ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමට නොහැකි බව සඳහන් කරමින් ප්‍රතික්ෂේප කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයට ආබාධ සහිත පුද්ගලයන් බඳවා නොගත යුතු බවට විධිවිධාන පවතීද;

(ii) නොඑසේ නම්, ලියනගේ මහතාට යුක්තිය ඉටුකිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

266/'18

ගරු හේෂා විතානගේ මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 - 2015 කාලය තුළ ආරම්භ කරනු ලැබූ උදාගම් නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ව්‍යාපෘතිවල නිවාස ප්‍රතිලාභීන් තෝරා ගැනීමට අනුගමනය කරනු ලැබූ ක්‍රමවේදය කවරේද;

(iii) අදාළ ව්‍යාපෘති හරහා ප්‍රතිලාභීන් ලෙස සහන ලැබූ සංඛ්‍යාව කොපමණද;

(iv) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා රටේ නිවාස නොමැති ජනතාව වෙනුවෙන් ප්‍රමාණවත් සහයෝගයක් ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පැහැර හැර ඇති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

433/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 492 - අමුණුවැටිය ග්‍රාම නිලධාරි වසමේ, කලාවැව කුඹුරුයාය මැදින් අලහප්පෙරුමගම දක්වා දිවෙන කෘෂි මාර්ගය ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බවත්;

(ii) ගොවීන් 1000 ක් පමණ තමන්ගේ එදිනෙදා කටයුතු සිදු කිරීමට මෙම මාර්ගය යොදා ගන්නා අතර අස්වනු නෙලන සමයේ දී ඔවුන් තම අස්වැන්න මෙම කෘෂි මාර්ගය ඔස්සේ ප්‍රවාහනය කිරීමේදී බොහෝ දුෂ්කරතාවන්ට ලක්වන බවත්;

(iii) මෙම මාර්ගය අවුරුදු 30 කින් පමණ ප්‍රතිසංස්කරණය කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ගය මේ වනතෙක් ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතුව කවරේද;

(ii) මේ සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

459/'18

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016.01.01 දින සිට 2017.04.30 දින දක්වා ජනාධිපතිවරයා විසින් සිදුකර ඇති විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) සංචාරය කරන ලද රටවල්වල නම් කවරේද;

(iii) එක් එක් සංචාරය සඳහා දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ජනාධිපතිවරයා සමඟ එක් එක් සංචාරය සඳහා සහභාගී වූ අමාත්‍යවරයන්, මන්ත්‍රීවරයන් සහ නිලධාරීන් ඇතුළු සමස්ත සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ජනාධිපතිවරයා සමඟ සංචාරවලට සහභාගි වූ සෙසු පුද්ගලයන්ගේ තනතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

475/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ඌව පළාත් සභාව තුළ සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින අක්‍රමිකතා සම්බන්ධව විගණකාධිපතිවරයාගේ අංක SIN/B/AG/KI/2017/02 හා 2017 අප්‍රේල් 20 දින ඌව පළාත් ප්‍රධාන ලේකම් වෙත යවා ඇති විමර්ශන වාර්තාව පිළිබඳ එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වාර්තාවේ ඌව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදේශකවරුන් පත්කිරීම සම්බන්ධව අනාවරණය කර ඇති අංක 2 (අ) (i) සිට (x) දක්වා කරුණු;

(ii) එම අනාවරණයන්ට අදාළව අංක 2 (අ) (i) සිට (xiii) දක්වා නිරීක්ෂණය කර ඇති කරුණු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

534/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පැල්මඩුල්ල, කිරිබත්ගල කන්ද නායයෑම හේතුවෙන් එම ගමේ පවුල් 30කට ආසන්න පිරිසකට උන්හිටිතැන් අහිමි වූ බවත්;

(ii) ආපදාවට ලක් වූ පවුල් සඳහා විකල්ප ඉඩම් ලබාදීමට තීරණය කර ඇත්තේ ගමෙන් කි.මී. 20ක පමණ ඈතින් පිහිටි දොඹගම්මන නමැති ප්‍රදේශයෙන් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එලෙස දුර බැහැර ප්‍රදේශවලින් ලබාදී ඇති ඉඩම් වෙනුවට එම ගමට ආසන්නයේ පිහිටි කිරිබත්ගල රාජ්‍ය වතුයායෙන් ඉඩම් ලබාදෙන ලෙස ඔවුන් ඉල්ලා ඇති බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඔවුන්ට කිරිබත්ගල රාජ්‍ය වතුයායෙන් ඉඩම් ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

559/'18

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාදම්පේ, ඓතිහාසික තනිවැල්ල දේවාලය අසළ කිනිපිටිය වැව නමින් වැවක් තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම වැවේ ජලයෙන් වගා කරන කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එමඟින් ප්‍රතිලාභ ලබන ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iv) අද වනවිට එම වැවේ විවිධ ජලජ ශාක වැඩී වැව ඉතා අබලන් තත්ත්වයට පත්වී තිබෙන බව දන්නේද;

(v) එසේ නම්, එම වැව කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

577/'18

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වී ඇති වකුගඩු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝගීන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව කොපමණද;

(iii) එම රෝගීන්ට අවශ්‍ය වෛද්‍ය පහසුකම් හා වෙනත් පහසුකම් ලබා දීමට අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

(iv) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඉතා වේගයෙන් පැතිර යන වකුගඩු රෝගය පාලනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

594/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආචාර්ය අයි. එච්. කේ. මහානාම මහතා, ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් තනතුර දැරීමට පෙර අග්‍රාමාත්‍ය අතිරේක ලේකම් තනතුර ද දරා ඇති බවත්;

(ii) එම කාලයේදී ප්‍රධාන ගණන්දීමේ නිලධාරි ලෙස අමාත්‍යාංශ ටෙන්ඩර් මණ්ඩලවල තීරණ ගැනීම පමණක් නොව අමාත්‍ය මණ්ඩලය පත්කළ ටෙන්ඩර් මණ්ඩලවල ද කටයුතු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඖෂධ ආනයනය වැනි කටයුතු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය පත්කළ ටෙන්ඩර් මණ්ඩලවල සභාපති/සාමාජික ලෙස මහානාම මහතා කටයුතුකර ඇති දින වකවානු හා දරා ඇති තනතුරු කවරේද;

(ii) එම ටෙන්ඩර් මණ්ඩලවලට ටෙන්ඩර් ඉදිරිපත් කර ඇති ආයතන සහ ඒවායේ සභාපති, කළමනාකාර අධ්‍යක්‍ෂක හා අධ්‍යක්‍ෂක මණ්ඩල සාමාජිකයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) ඉදිරිපත්ව තිබූ ටෙන්ඩර්වලින් අනුමතිය ලද ටෙන්ඩර්වලට අදාළ ආයතන හා මිල ගණන් කවරේද;

(iv) මහානාම මහතාගේ සභාපතිත්වයෙන් හෝ සහභාගිත්වය සහිත ටෙන්ඩර් මණ්ඩලවල අනුමතිය මත මෙරටට ආනයනය කර ඇති ඖෂධ වර්ග, ප්‍රමාණයන් හා රටවල් කවරේද;

(v) 2010 වර්ෂයේ සිට මේ දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අමාත්‍ය මණ්ඩල ටෙන්ඩර් මණ්ඩල රැස්වූ දිනයන් සහ එහි සාමාජිකයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

989/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, මැදගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එම කොට්ඨාසය තුළ කැණීම් නොකරන ලද එහෙත්, හඳුනාගත් පුරාවිද්‍යාත්මක ස්ථාන පිහිටා තිබේද;

(iii) එසේ නම්, ඒවා කවරේද;

(iv) ඉහත කොට්ඨාසයේ පිහිටි පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත රජමහා විහාර සංඛ්‍යාව කොපමණද; ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත පුරාවිද්‍යාත්මක ස්ථානවල සංරක්‍ෂණ කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1111/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට මරණ දඬුවම නියමව බන්ධනාගාරගත කර ඇති සිරකරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2010 සිට මේ දක්වා මරණ දඬුවම නියම වූවන්ගෙන් ජීවිත සමාව ලැබ නිදහස් වූ සිරකරුවන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iii) මරණ දඬුවම අහෝසි කළ කාලසීමාවේදී ක්‍රියාත්මක කරන ලද, වසර 4 හෝ 8 කාලය සමාලෝචනය කිරීම මඟින්, මරණ දඬුවමට යටත්ව ජීවිතාන්තය දක්වා සිරගතවූවන්ට පොදු සහන ලබා දීමේ ක්‍රමය මේ වනවිටත් ක්‍රියාත්මක වන්නේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(v) මරණ දඬුවමට ලක්වූවන් නිදහස් කිරීමේදී ඔවුන්ට වඩා වැඩි කාලයක් එම දඬුවමට මුහුණු දුන් යහපත් කල් ක්‍රියාවෙන් පසු වූවන් නිදහස් කර නොතිබේද;

(vi) එසේ නම්, එයට හේතු සඳහන් කරන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1140/'18

ගරු මුහම්මදු නසීර් මහතා,— අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ දිවයින පුරා ක්‍රියාත්මක වන ක්වාසි අධිකරණ කලාප කවරේද;

(ii) එම කලාපවල සිටින ක්වාසි විනිසුරුවරයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් ක්වාසි විනිසුරුවරයා පත්කරන ලද දිනය සහ පත්වීම් කාලය අවසන් වන දිනය කවරේද;

(iv) එම එක් එක් ක්වාසි විනිසුරුවරයාගේ අධ්‍යාපන, වෘත්තිය සහ වෙනත් සුදුසුකම් කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පනත යටතේ ක්වාසි විනිසුරුවරයන් පත්කිරීමේදී සලකා බලනු ලබන අධ්‍යාපන, වෘත්තිය සහ වෙනත් සුදුසුකම් කවරේද යන්නත් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1151/'18

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2010 සිට 2017 දක්වා -

(i) මහවැලි 'එච්' කලාපයට වාරි ජලය ලැබෙන මහවැලියේ ඉහළ ජලාශ අවට ප්‍රදේශවලට ලැබුණු වර්ෂාපතනය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(ii) වගා කළ කුඹුරු ඉඩම් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iii) ජල හිඟය හේතුවෙන් වගා කිරීමට නොහැකි වූ ගොවීන්ට සහන ලබා දුන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සහනය ලබාදුන් ආකාරය කවරේද;

(ii) නැවත වගා කටයුතු ආරම්භකර අස්වැන්න ලැබෙනතුරු මෙම සහන ක්‍රමය ක්‍රියාත්මක වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 නොවැම්බර් 10 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

30/'18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ ඇති ජාත්‍යන්තර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම ජාත්‍යන්තර පාසල්වල ගුරුවරුන් බඳවා ගැනීම, ගාස්තු අයකිරීම වැනි කටයුතු නියාමනය කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

65/'18

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 289ට අනුව, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග කවරේද;

(ii) 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් මේ දක්වා ලඟාකර ගත් ප්‍රගතිය කවරේද; ඒ පිළිබඳ වගකීම පවරා ඇති පුද්ගලයන් කවුරුන්ද;

(iii) ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය ශක්තිමත් කිරීමට 2016 අයවැයෙන් වෙන්කර දුන් රුපියල් මිලියන 100 උපයෝජනය කරගත් ආකාරය පැහැදිලි කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

195/'18

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2016 වර්ෂයේදී කොස්ගම, සාලාව යුද හමුදා අවි ගබඩාව පිපිරී යෑමෙන්,

(i) මියගිය සංඛ්‍යාව කොපමණද;

(ii) ආබාධිත වූ සංඛ්‍යාව කොපමණද;

(iii) විපතට පත් පුද්ගලයන්ට රජය විසින් ගෙවන ලද මුළු වන්දි මුදල කොපමණද;

(iv) මියගිය පුද්ගලයෙකු වෙනුවෙන් රජය විසින් ගෙවන ලද වන්දි මුදල කොපමණද;

(v) හානියට පත් නිවාස වෙනුවෙන් ගෙවන ලද උපරිම සහ අවම වන්දි මුදල කොපමණද;

(vi) අවතැන් වූ සියලුම දෙනාට ස්ථිර නිවාස ලබා දී තිබේද;

(vii) අවතැන් වූ පවුලකට ස්ථිර නිවාසයක් ලබා දුන් ආසන්නතම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

270/'18

ගරු හේෂා විතානගේ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කය තුළ කුඹුරු ඉඩම් ගොඩකිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අවසර ලබාදී තිබේද;

(ii) එසේ නම්, එලෙස අවසර ලබා දී ඇති පුද්ගලයන්ගේ නම් කවරේද;

(iii) ඇඹිලිපිටිය, උඩගම හන්දිය අසළ කුඹුරු ඉඩමක් මේ වනවිට ගොඩකිරීමට ලක්වී ඇති බවත්, ප්‍රදේශයේ ජනතා විරෝධතා හේතුවෙන් නතර වී ඇති බවත් දන්නේද;

(iv) මේ සඳහා අවසර ලබා දී තිබේ නම්, එම පදනම කවරේද;

(v) දැනට ගොඩකර ඇති මෙම කුඹුරු ඉඩමේ ගොඩකරන ලද පස් ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

435/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කලාවැව සිට තිසාවැව දක්වා ජලය ගෙන යන යෝද ඇල බැම්ම හා සමඟ ඇති මාර්ගය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට අයත් බවත්;

(ii) මෙම මාර්ගයේ ගම්මාන 6ක පදිංචිකරුවන් ගමන් ගන්නා අතර, මෙය අවුරුදු 30ක පමණ කාලයක් ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන් ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ගය මේ වනතෙක් ප්‍රතිසංස්කරණය නොකිරීමට හේතුව කවරේද;

(ii) මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

498/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ව්‍යාපෘතියේ නම, අපේක්ෂිත අරමුණු සහ ආවරණය වන ප්‍රදේශය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා බඳවාගත් සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම සේවකයන් බඳවාගත් ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

561/'18

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වයඹ පළාත් සභාව යටතේ ක්‍රියාත්මක වන, පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි රෝහල්, මධ්‍යම බෙහෙත්ශාලා සහ ආයුර්වේද රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ස්ථානවල නම් කවරේද;

(iii) ඉහත එක් එක් සෞඛ්‍ය මධ්‍යස්ථානවල සේවයේ නියුතු මුළු සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සෞඛ්‍ය මධ්‍යස්ථානවල සේවක පුරප්පාඩු පවතීද;

(v) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

(vi) එම සෞඛ්‍ය මධ්‍යස්ථාන දියුණු කිරීමට සහ සේවක පුරප්පාඩු පිරවීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

954/'18

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇන්ටේ ලෙකෝ ප්‍රයිවට් ලිමිටඩ් (Ante Leco (pvt) Ltd.) සමාගම පිළිබඳ රජයට ඇති අයිතිය කවරේද;

(ii) එම සමාගම ආරම්භ කරන ලද අරමුණ කවරේද;

(iii) එම සමාගම විසින් නිෂ්පාදනය කර ඇති විදුලි මීටර් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සමාගමේ සේවක සංඛ්‍යාව කොපමණද;

(v) ආරම්භයේ සිට එම සමාගම ලබා ඇති ලාභය හෝ පාඩුව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1000/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස්, හෝ වැලි සඳහා ටෙන්ඩර් කරනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1121/'18

ගරු කනක හේරත් මහතා,— රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින් සතු ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ගුවන් යානය භාවිතා කර ඇති කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කල්බදු ගිවිසුම් අවසන් වීමෙන් පසු අදාළ සමාගම් වෙත නැවත ලබා දුන් ගුවන් යානා භාවිතා කර ඇති කාලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙලෙස නැවත ලබා දුන් ගුවන් යානාවලට වඩා පැරණි ගුවන් යානා සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින් සතුව කල්බදු ක්‍රමය යටතේ තවමත් භාවිතා කරනු ලබන්නේද;

(iii) එසේ නම්, මෙතරම් පැරණි ගුවන් යානා මෙතෙක් රඳවා ගැනීමට ඇති අවශ්‍යතාවය කවරේද;

(iv) ඒ සඳහා වන නිර්ණායක කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1134/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2018 මැයි මස මුල් කාල සීමාවේදී ආරම්භ වූ වසංගත උණ රෝගී තත්ත්වය ඇති වීමට හේතු කවරේද;

(ii) එම වසංගත රෝගී තත්ත්වයට ලක් වූ බවට වාර්තා වූ රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අතරින් රෝගී දරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම රෝගී තත්ත්වය මත මියගිය මුළු සංඛ්‍යාව කොපමණද;

(v) මියගිය දරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම රෝගයේ විශේෂ ලක්ෂණ කවරේද;

(ii) ඒ සඳහා ප්‍රමාණවත් ඖෂධ රෝහල් සතුව පැවතියේද;

(iii) රෝගය පාලනය කිරීම සඳහා රජය ගත් පියවර සඳහන් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1139/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට දිවයිනේ තිබෙන මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මහ නගර සභා තත්ත්වයට පත් කිරීමට අපේක්ෂිත නගර සභා කවරේද;

(iii) නගර සභා තත්ත්වයට පත් කිරීමට අපේක්ෂිත ප්‍රාදේශීය සභා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2010 වසරේ සිට 2018 මැයි දක්වා වූ කාලය තුළ අමාත්‍යාංශය මඟින් ට්‍රැක්ටර්, ගලිබවුසර්, වතුර බවුසර් ඇතුළු විවිධ යන්ත්‍ර - සූත්‍ර ලබා දුන් පළාත් පාලන ආයතනයන්හි නම, ලබාදුන් උපකරණ, ඒවා ලබාදුන් දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉදිරියටත් එවැනි යන්ත්‍ර-සූත්‍ර ඇතුළු උපකරණ හා මෙවලම් ලබාදීමට අපේක්ෂිත පළාත් පාලන ආයතන හඳුනාගෙන තිබේ නම්, ඒවා කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1167/'18

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ නායයෑමේ අවදානමට ලක්විය හැකි යැයි හඳුනාගෙන ඇති ප්‍රදේශ කවරේද;

(ii) එම ප්‍රදේශ තුළ පදිංචිවී සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) නායයෑමේ අවදානමට ලක්විය හැකි ප්‍රදේශ තුළ ජීවත් වන පවුල් වෙනත් ස්ථානයක පදිංචි කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1187/'18

ගරු බිමල් රත්නායක මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1335/'18

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010 වර්ෂයේදී, ''ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණයක්'' යන තේමාව යටතේ, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ නගර මධ්‍යයේ පිහිටි පොදු ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර අවුරුදු 09ක් ගතවී ඇතත්, මේ දක්වා එම ක්‍රීඩාංගණය කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ක්‍රීඩකයන්ගේ භාවිතය සඳහා ලබාදී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ක්‍රීඩාංගණය ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණයක්ද; නොඑසේ නම්, දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩාංගණයක්ද;

(ii) මෙම පොදු ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු සඳහා වෙන්කරන ලද මුදල කොපමණද;

(iii) පසුගිය වර්ෂ 09ක කාලය තුළදී මෙම මුදලින් වියදම් කරන ලද ප්‍රමාණය කොපමණද;

(iv) මෙම ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු සඳහා මේ දක්වා ගිවිසුමට එළඹී ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ සංඛ්‍යාව කවරේද;

(v) මේ වනවිට කොන්ත්‍රාත් කටයුතුවල නිරත වන කොන්ත්‍රාත්කරුවන්ගේ මෙහෙයුම් කටයුතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් දිස්ත්‍රික්කයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් කොතරම් දුරට අපහසුවට පත්වී සිටින්නේද;

(ii) කිළිනොච්චි දිස්ත්‍රික්කයේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 නොවැම්බර් 12 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

66/'18

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 288 හි සඳහන් කොටස් වෙළඳපොළ තැරැව්කරුවන් මුහුණ දී සිටි අර්බුදයන් කවරේද;

(ii) උක්ත අර්බුදයන් විසඳීම සඳහා, රජයේ මැදිහත් වීම සිදු වූ ආකාරය කවරේද;

(iii) වර්ෂ 2014 සිට 2016 දක්වා ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපොළ තුළ ක්‍රියාත්මක වූ තැරැව්කරුවන් සංඛ්‍යාව; ඔවුන්ගේ ප්‍රාදේශීය ව්‍යාප්තිය සහ එක් එක් වර්ෂයේ තැරැව්කාර ගණුදෙනු ප්‍රමාණය දැක්වෙන දත්ත වගුවක් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(iv) 2016 වර්ෂය තුළදී ඒකාබද්ධ වූ කොටස් වෙළඳපොළ තැරැව්කරුවන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

149/'18

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ දිනවල මාතලේ දිස්ත්‍රික්කයේ ගව කුර රෝගය බහුල ලෙස ව්‍යාප්ත වෙමින් පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම තත්ත්වය පාලනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

173/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) එක්සත් රාජධානියේ, ඩාට්මත් (Dartmouth) හි රාජකීය නාවික ඇකඩමියේ පුහුණුව සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් තෝරා යවනු ලැබූ නාවික නිලධාරීන්ගේ නම් කවරේද;

(ii) එම පුහුණුවෙන් පසු, එක් එක් නිලධාරියා නාවික හමුදාවේ සේවය කළ කාලය සහ සේවය අවසන් කරන විට දැරූ නිලය වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(iii) ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් සඳහා එම පුහුණු අවස්ථා තවමත් ලබා දෙන්නේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

271/'18

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සබරගමුව පළාතේ දැනට සේවයේ නියුතු උපාධිධාරී ගුරුවරුන් සහ විද්‍යාපීඨ ඩිප්ලෝමාධාරී ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) යහපාලන රජය බලයට පත් වීමෙන් පසුව සබරගමුව පළාතට අනුයුක්ත කළ උපාධිධාරී ගුරුවරුන් සංඛ්‍යාව සහ එම කාල සීමාව තුළ බඳවාගත් උපාධිධාරී ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සබරගමුව පළාතේ පවතින උපාධිධාරී සහ විද්‍යාපීඨ ගුරු හිඟය පියවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

500/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ස්ථාපනය කරන ලද වර්ෂය කවරේද;

(ii) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගමේ ආරම්භක අරමුණු කවරේද;

(iii) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ස්ථාපිත කළ දින සිට අවසන් අධ්‍යක්ෂ මණ්ඩලය දක්වා එහි අධ්‍යක්ෂ මණ්ඩලවල සිටි පුද්ගලයන්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් සහ ලැබූ වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ආරම්භයේ සිට ලැබූ අලාභය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ණය, ලබාගත් ණය ගෙවීමට ඇති රාජ්‍ය ආයතන හා එම ණය ප්‍රමාණයන් කවරේද;

(vi) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගමේ අනාගතය සම්බන්ධයෙන් රජය ගැනීමට බලාපොරොත්තුවන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

537/'18

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2016 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා විභාගයේ ප්‍රතිඵල නිකුත් වූ බව සඳහන් කරමින් පුරප්පාඩු 980ක් සඳහා බඳවාගෙන ඇති බවත්;

(ii) නමුත්, මේ වනතෙක් විභාගයට පෙනී සිටි සෙසු අපේක්ෂකයන්ට ප්‍රතිඵල ලේඛනය පවා යවා නොමැති බවත්; අන්තර්ජාලයෙන්ද ලබාගැනීමට ඉඩක් නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ පිළිබඳව සොයා බලා ඉතිරි ප්‍රතිඵල නිකුත් කිරීමට පියවර ගෙන, ඒ අනුව සුදුසුකම් ලබන්නන් පුරප්පාඩු අනුව බඳවා ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

601/'18

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "වැවක් සමඟ ගමක්" වැඩසටහන යටතේ වයඹ පළාතේ මේ දක්වා දියුණු කරන ලද ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම වැඩසටහන සඳහා තෝරාගෙන ඇති ගම්මානවල නම් කවරේද;

(iv) ඉදිරියේදී මෙම වැඩසටහන වයඹ පළාත තුළ ක්‍රියාත්මක වන ආකාරය සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

955/'18

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල, මල්ලවපිටිය ලංකා විදුලිබල මණ්ඩල කාර්යාල පරිශ්‍රයේ දැවැන්ත විදුලි උත්පාදන යන්ත්‍ර සමූහයක් ස්ථාපිත කර තිබෙන බවත්;

(ii) මෙම යන්ත්‍ර ක්‍රියාත්මක වීමේදී පිටවන අධික ශබ්දය හේතුවෙන් අවට ජනතාව දැඩි පීඩාවකට ලක්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම යන්ත්‍ර සවිකිරීම සඳහා පාරිසරික ඇගයීම් වාර්තාවක් ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, පාරිසරික ඇගයීම සිදුකළ ආයතනය කවරේද;

(iii) මෙම ගැටලුව විසඳීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

976/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි තඹුත්තේගම රෝහලේ වෛද්‍යවරු ඇතුළු අනෙකුත් කාර්ය මණ්ඩලවල පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පවතින බවත්;

(ii) මේ සම්බන්ධයෙන් 2017.09.27 වැනි බදාදා "ලංකාදීප" පුවත්පතේ "රජරට අතිරේකයේ" ප්‍රවෘත්තියක් පළකර තිබූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ප්‍රවෘත්තියේ සඳහන් අඩුපාඩු සපුරාලීමට යම්කිසි ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද;

(ii) නොඑසේ නම්, මෙම අඩුපාඩු සපුරා ජනතාවට ඵලදායී සේවාවක් ලබාදීමට කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1136/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 නොවැම්බර් මස දිනයක ක්වාලාලම්පූර් බලා විදේශගතවීමට සිටි මැලේසියානු ව්‍යාපාරික ජයසුධීර් ජයරාම් ඇතුළු තිදෙනෙක් මෙරටින් මුදල් අපහරණය කිරීම මත ශ්‍රී ලංකා රේගුව විසින් අත්අඩංගුවට ගනු ලැබුවේද;

(ii) එසේ නම්, ඔවුන් අත්අඩංගුවට ගන්නා ලද අවස්ථාවේ ඔවුන් සන්තකයේ තිබූ මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) ඔවුන්ට එරෙහිව ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අත්අඩංගුවට ගත් පුද්ගලයන් අදාළ පරීක්ෂණ අවසන් වීමට පෙර ක්වාලාලම්පූර් බලා යෑමට නිදහස් කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද;

(iii) ඒ සඳහා වූ පරීක්ෂණ එම පුද්ගලයන් නොමැතිව සිදු කර තිබේද;

(iv) මේ වනවිට අදාළ ලිපිගොනු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සතුව පවතීද;

(v) අත්අඩංගුවට ගත් මුදල් නැවතත් එම පුද්ගලයන් වෙත මුදා හැර තිබේද;

(vi) නොඑසේ නම්, මේ වනවිට එම මුදල් තැන්පත් කර ඇති ආයතනය කවරේද;

(vii) මෙම පරීක්ෂණය සඳහා දායක වූ රේගු නිලධාරීන්ට ත්‍යාග මුදල් ලබා දී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1142/'18

ගරු මුහම්මදු නසීර් මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2012 ජනවාරි සිට 2018 අප්‍රේල් දක්වා කාල වකවානුවලදී නාඳුනන කඩාකප්පල්කාරී පුද්ගලයන්ගේ ප්‍රහාරයකට ලක්වී ඇති සහ ගිනි තැබීම් සිදුවී ඇති මුස්ලිම් පල්ලි සංඛ්‍යාව සහ එම සිද්ධීන් පිළිබඳව පොලිස් ස්ථානවලට වාර්තාවී ඇති පැමිණිලි සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් කොපමණද;

(ii) එම වාර්තාවී තිබෙන එක් එක් පොලිස් පැමිණිලි අංක, දින සහ එම පොලිස් බල ප්‍රදේශයන් කවරේද;

(iii) එම පැමිණිලි අතරින් මූලික විමර්ශන කටයුතු අවසන් කොට තිබෙන සහ අධිකරණ ක්‍රියාමාර්ග සඳහා යොමු වී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම එක් එක් පැමිණිලි අනුව අධිකරණය හමුවේ ගොනුකර ඇති නඩුවේ අංක හා අධිකරණ බල ප්‍රදේශයන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1168/'18

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂය සඳහා "දිවියට උදානය" වැඩසටහන යටතේ සුළු පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් මාතර දිස්ත්‍රික්කයට වෙන්කර ඇති මූල්‍ය ප්‍රතිපාදනය කොපමණද;

(ii) වෙන්කරන ලද මූල්‍ය ප්‍රතිපාදන 2017 වර්ෂයේදී නිදහස් නොකිරීමට හේතු කවරේද;

(iii) තෝරාගත් ප්‍රතිලාභීන්ට ඔවුන් නියැලෙන ක්ෂෙත්‍රයන් සඳහා උපාංග ලබාදීමට කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1170/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාල ජාතික වනෝද්‍යානය තුළ පිහිටි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු සංචාරක බංගලාවල සුනඛයන් ඇති කරන බව දන්නේද;

(ii) ජාතික වනෝද්‍යානයක් තුළට සුනඛයන් ඇතුළු වූ විට, ඔවුන් පිටතට යැවීම හෝ වෙඩි තබා ඝාතනය කිරීම උද්‍යාන භාරකරුගේ වගකීම වුවද, යාල නිව් බුතව බංගලාවේ සිටි සුනඛයකු කොටින්ගේ ගොදුරක් වන සේ නිදැල්ලේ අත හැර දැමීම සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(iii) සංචාරකයන්ට කොටි පෙන්වීම සඳහා සුනඛයන් ඇමක් ලෙස යොදා ගැනීමට උද්‍යාන භාරකරු විසින් සෆාරිකරුවන්ට ඉඩ ලබා දී තිබීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iv) එසේ නම්, එහි නිගමන කවරේද;

(v) යාල ජාතික වනෝද්‍යානයට ඇතුළු වීම හේතුවෙන් වෙඩිතබා හෝ පිටතට ගෙනවිත් දමා ඇති සුනඛයන් සංඛ්‍යාව කොපමණද;

(vi) මෙවැනි සිද්ධීන් හේතු කොට ගෙන පරිසරවේදීන්ගේ හා සංචාරකයන්ගේ විවේචනයට ලක්වී ඇති යාල ජාතික වනෝද්‍යානයේ පරිපාලනය සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1188/’18

ගරු බිමල් රත්නායක මහතා,— කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1266/’18

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ ස නැගෙනහිර හේවාගම් කෝරළයේ විවිධ සේවා සමූපකාර සමිතිය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ පාලනය වන මූල්‍ය සමාගමක් හරහා භාණ්ඩාගාර බිල්පත් ඉල්ලුම් කර, ලබාගෙන හෝ වෙන්කරගෙන තිබේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

(iii) මෙම ගනුදෙනුව සිදු වී ඇති දිනය කවරේද;

(iv) මෙම සමිතියේ මුදල්වලට සිදුවී ඇත්තේ කවරක්ද;

(v) මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට වගකීමක් නොමැතිද;

(vi) මෙම මුදල් තැන්පත් කර ඇති ආයතනය මේ වනවිට ක්‍රියාත්මකව පවතින්නේද;

(vii) මෙම සමාගමේ අයිතිකරුවන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සී/ ස නැගෙනහිර හේවාගම් කෝරළයේ විවිධ සේවා සමූපකාර සමිතියේ ග්‍රාමීය බැංකු තැන්පත්කරුවන් වෙනුවෙන් ඉදිරියේ දී ගනු ලබන පියවර කවරේද;

(ii) සමූපකාර අධක්ෂක මණ්ඩලයට රජයේ බැංකුවක හැර පුද්ගලික මූල්‍ය සමාගමක මුදල් ආයෝජනය කළ හැකිද;

(iii) ජනතාවගේ මුදල් තම හිතුමතේට තැන්පත් කිරීම හේතුවෙන් සිදුවී ඇති පාඩුව අධක්ෂක මණ්ඩලයෙන් අය කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) මේ සම්බන්ධයෙන් රජයට ගත හැකි ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 නොවැම්බර් 13 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

31/’18

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය වන මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් එක් එක් අධ්‍යාපන කොට්ඨාසය අනුව කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය වූ පාසල් වැසීගොස් තිබේ නම්, එම පාසල් වල නම් කවරේද;

(iv) එම පාසල් නැවත විවෘත කිරීමට හෝ වැසීගිය පාසල්වල සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට අමාත්‍යාංශය අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

67/'18

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 287හි සඳහන් පරිදි පහත වැටී ඇති කොටස් ගනුදෙනු ඉහළ නැංවීමට අදාළව සිදු කළ බදු සංශෝධන කවරේද;

(ii) එකී එලදායී වෙනස්කම් හේතුවෙන් පහත වැටී ඇතැයි සඳහන් වූ කොටස් ගනුදෙනු ඉහළ ගිය ප්‍රමාණය, අදාළ දර්ශක යොදා ගනිමින් පැහැදිලි කරන්නේද;

(iii) 2009 වර්ෂයෙන් පසු මේ දක්වා එක් එක් වර්ෂයේ කොටස් වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය පිළිබඳ දත්ත සටහනක් ඉදිරිපත් කරන්නේද;

(iv) යුද ගැටුම් නිමවීමෙන් පසුව, වර්ෂ 2010 සිට 2017 දක්වා ශ්‍රී ලංකාවේ කොටස් වෙළඳපොළෙහි විදේශ ආයෝජනයන්හි උපනතීන් පැහැදිලි කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

186/'18

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ග්ලයිෆොසේට් තහනම් කිරීමට රජය තීරණය කළ දිනය කවරේද;

(ii) ඒ සඳහා බලපෑ හේතු කවරේද;

(iii) එම තහනම සඳහා නිර්දේශ ඉදිරිපත් කළ විද්වත් සංවිධාන හෝ පුද්ගලයන් කවුරුන්ද;

(iv) ග්ලයිෆොසේට් තහනම ඉවත් කිරීමට රජය තීරණය කළ දිනය කවරේද;

(v) ඒ සඳහා බලපෑ හේතු කවරේද;

(vi) තහනම ඉවත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කළ විද්වත් සංවිධාන හෝ පුද්ගලයන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

206/'18

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2017.07.31 දිනට රැකියා දස ලක්ෂයේ රජයේ ව්‍යාපෘතිය යටතේ ලබා දී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

272/'18

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇඹිලිපිටිය චන්ද්‍රිකා වැවෙන් පානීය හා කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය ලබාගන්නා පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඇඹිලිපිටිය සතිපොළේ අපද්‍රව්‍ය චන්ද්‍රිකා වැවට එක්වීම නිසා විශාල පරිසර දූෂණයක් සිදුවන බව දන්නේද;

(iii) එසේ නම්, එම තත්ත්වය අවම කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

603/'18

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුවට මුහුණ පා සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් පදිංචි ග්‍රාම නිලධාරි වසම්වල නම් කවරේද;

(iii) පානීය ජල ගැටලුවට විසඳුම් ලබාදීම සඳහා "පුත්තලමට නවෝදය" වැඩපිළිවෙළ යටතේ ගෙන ඇති පියවර කවරේද;

(iv) එම ව්‍යාපෘතිය යටතේ මේ වනවිට පුත්තලම දිස්ත්‍රික්කයේ පානීය ජල පහසුකම් ලබා දී ඇති පවුල් සංඛ්‍යාව ග්‍රාම නිලධාරි වසම් අනුව කවරේද;

(v) පුත්තලම දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුව විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

753/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළාත් සභා සඳහා උපදේශකයන් පත්කිරීමේ නීතිමය ක්‍රමවේදය කවරේද;

(ii) ඌව පළාත් සභාවේ උපදේශකයන් පත් කිරීම, ඔවුන්ට දීමනා ලබා දීම හා විදේශ සංචාරවල නිරත වීම සම්බන්ධයෙන් විගණන විමසුමක් සිදුකර තිබේද;

(iii) අදාළ විගණන විමසුමේ දැක්වෙන කරුණු කවරේද;

(iv) ඒ සඳහා පළාත් සභා නිලධාරින් ලබා දී ඇති පිළිතුරු ඉදිරිපත් කරන්නේද;

(v) මෙහිදී යම් වංචාවක්, විෂමාචාරයක් සිදු වී ඇත්නම්, ඒ සම්බන්ධයෙන් විෂය භාර අමාත්‍යවරයා වශයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

977/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන අලි තර්ජනය හේතුවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන්ගේ ගොවිතැන්වලට, නිවාසවලට හා ජීවිතවලට හානි පැමිණෙන බවත්;

(ii) ඒ සඳහා විසඳුම් ලබාදෙන මෙන් වනජීවී නිලධාරීන් දැනුවත් කළද, මෙතෙක් ස්ථිර විසඳුමක් ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් මේ වනවිට යම් පියවරක් ගෙන තිබේද;

(ii) නොඑසේ නම්, අදාළ නිලධාරීන් දැනුවත්කර, මෙම දිස්ත්‍රික්කයේ ජනතාවට වන අලින්ගෙන් සිදුවන හානි සම්බන්ධයෙන් විසඳුම් ලබා දෙන දිනය කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1001/'18

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016 සහ 2017 වර්ෂවලදී රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රතිසංස්කරණය කරන ලද සුළු, මධ්‍යම හා මහා වාරිමාර්ග කවරේද;

(ii) එක් එක් ප්‍රතිසංස්කරණ කටයුත්ත සඳහා ඇස්තමේන්තුගත මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(v) ඉහත එක් එක් වර්ෂවලට අදාළ ප්‍රතිසංස්කරණ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලට අදාළ ශක්‍යතා අධ්‍යයන, පාරිසරික සහ ඉංජිනේරු වාර්තා ඉදිරිපත් කරන්නේද;

(vii) එම ප්‍රතිසංස්කරණ කටයුතුවලදී ඉවත් කරන ලද රොන්මඩ, පස් හෝ වැලි සඳහා ටෙන්ඩර් කරනු ලැබුවේද;

(viii) එසේ නම්, එම ටෙන්ඩර් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1122/'18

ගරු කනක හේරත් මහතා,— රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම විසින් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් ගුවන් යානයක් එම සමාගම විසින් කල්බදු ක්‍රමය යටතේ වෙනත් ගුවන් සමාගමකට නැවත ලබා දී තිබේද;

(ii) එම ගුවන් යානය කල්බදු ක්‍රමය යටතේ ලබාගත් ලීසිං සමාගම සඳහා සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගම විසින් ගෙවනු ලබන මාසික කල්බදු වාරිකය කොපමණද;

(iii) නැවත කල්බදු ක්‍රමය යටතේ ලබා දී ඇති ආයතනය විසින් සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සමාගමට ගෙවනු ලබන මාසික කල්බදු වාරිකය කොපමණද;

(iv) ඉහත ගුවන් යානය ගුවන් මෙහෙයුම් බලපත්‍රයට සහ සිවිල් ගුවන් යානා ලියාපදිංචි ලේඛනයට ඇතුලත් වන්නේද;

(v) එම ගුවන් යානයට ලියාපදිංචි අංකයක් තිබේ නම්, එම අංකය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1137/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 වර්ෂයේ සිට මේ දක්වා,

(i) ශ්‍රී ලංකන් එයාර් ලයින් හරහා ආගමනය හා විගමනය කළ පුද්ගලයන් සංඛ්‍යාව;

(ii) පියාසර කළ වාර සංඛ්‍යාව;

(iii) එම ගුවන් සමාගම උපයන ලද ආදායම;

(iv) ලබන ලද ලාභය හෝ පාඩුව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2015 වර්ෂයේ සිට මේ දක්වා අලාභයක් සිදුවූයේ නම්, එම අලාභවලට හේතු එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1147/'18

ගරු මුහම්මදු නසීර් මහතා,— නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුර සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2009 වර්ෂයේදී යුධමය තත්ත්වය අවසන් වීමෙන් පසුව, උතුරු පළාතේ නැවත පදිංචි වූ සිංහල, දෙමළ සහ මුස්ලිම් තැනැත්තන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

477/'18

ගරු විමලවීර දිසානායක මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ කංසා වැවීම සඳහා රජය තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එම තීරණය ගැනීමට හේතු වූ පදනම කවරේද;

(iii) කංසා මත්ද්‍රව්‍යයක් බව පිළිගන්නේද;

(iv) කංසා භාවිතය හේතුවෙන් ශාරීරික හා මානසික සෞඛ්‍ය පිරිහෙන බව පිළිගන්නේද;

(v) දැනට කංසා වැවීම සඳහා නීත්‍යානුකූලව අවසර ලබාගත් පුද්ගලයන් හා ආයතන තිබේද;

(vi) එසේ නම්, නීත්‍යානුකූලව කංසා වගා කර ඇති ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1189/'18

ගරු බිමල් රත්නායක මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වරාය හා නාවික කටයුතු අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1336/'18

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශය විසින් උතුර හා නැගෙනහිර පළාත්වල පාලම් 1000ක් ඉදිකිරීමේ සැලැස්මක් ඉදිරිපත් කරනු ලැබූ බවත්;

(ii) මෙම ව්‍යාපෘතිය එම ප්‍රදේශයේ ජනතාවගේ ක්‍රියාකාරකම්වලට ප්‍රයෝජනයක් නොවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම පාලම් 1000 ව්‍යාපෘතිය යටතේ උතුරු පළාතේ එක් එක් දිස්ත්‍රික්කය තුළ ඉදිකරන ලද පාලම් පිළිබඳ විස්තර කවරේද;

(ii) මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුවන්ගේ විස්තර කවරේද;

(iii) මෙම පාලම් සඳහා වන සැලසුම් එම ප්‍රදේශවලට ගැලපෙන ආකාරයට සකස් කර තිබේද;

(iv) නොඑසේ නම්, විදේශ රටක සකස් කළ ආකෘතියකට අනුව වැඩකටයුතු සිදුකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ව්‍යාපෘතිය යටතේ මුදල් වෙන්කර ඇති කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ පාලම් සංඛ්‍යාව කොපමණද;

(ii) වැඩ අවසන් වූ පාලම් සංඛ්‍යාව කොපමණද;

(iii) තවමත් ඉදිවෙමින් පවතින පාලම් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉදිකිරීමට නියමිත පාලම් සංඛ්‍යාව කොපමණද;

(v) මෙම පාලම්වල කොන්ත්‍රාත්කරුවන්ගේ විස්තර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 නොවැම්බර් 14 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

68/'18

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 286ට අනුව, රජයේ සුරකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය වෙනුවෙන්, "බැඳුම්කර නිශ්කාෂන" ආයතනයක් පිහිටුවනු ලැබුවේද;

(ii) ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අධීක්ෂණය යටතේ අලෙවි ව්‍යුහයක් පිහිටුවීම සඳහා රජයේ ඒකාබද්ධ අරමුදලින් වෙන්කළ රුපියල් මිලියන 500ක් උපයෝජනය කළ ආකාරය පැහැදිලි කරන්නේද;

(iii) වර්ෂ 2015 සිට 2017 දක්වා රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළෙහි විදේශීය ආයෝජකයන්ගේ හැසිරීම කෙබඳු වීද; ඔවුන් විසින් එක් එක් වර්ෂයේදී ආපසු කැඳවූ ආයෝජන වටිනාකම එක්සත් ජනපද ඩොලර්වලින් කොපමණද;

(iv) 2018 වර්ෂයේ සිට විදේශීය ආයෝජකයන්, ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් වෙළෙඳපොළ කෙරෙහි ආකර්ෂණය කර ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

273/'18

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට සබරගමු පළාතේ සිටින රැකියා විරහිත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව එම සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) යහපාලන රජය බලයට පත්වීමෙන් පසුව මේ දක්වා සබරගමු පළාත තුළ රැකියා ලබා දී ඇති උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) සෙසු රැකියා විරහිත උපාධිධාරීන්ටද රජයේ හා පෞද්ගලික අංශයේ රැකියා ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

754/'18

ගරු චමින්ද විජේසිරි මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඩෙංගු රෝගය රට පුරා ව්‍යාප්ත බව දන්නේද;

(ii) එසේ නම්, 2015 වර්ෂයේ සිට මේ දක්වා ඩෙංගු රෝගයෙන් මියගිය සංඛ්‍යාව, එක් එක් පළාත් පාලන ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පළාත් පාලන ආයතන නිසි පරිදි සිය කටයුතු ඉටු නොකිරීම නිසා ඩෙංගු රෝගය ව්‍යාප්ත වන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා පළාත් පාලන ආයතන බල ගැන්වීම සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

978/'18

ගරු ඉෂාක් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කලාවැව සිට අනුරාධපුර තිසාවැව දක්වා ජලය ලබාදෙන කලාවැව, පරණ යෝධ ඇල, ජපන් ජබර වැනි ජලජ පැළෑටිවලින් වැසී ඇති බැවින් ජලය අපතේ යන බවත්;

(ii) ගොවිතැන් කටයුතු සඳහා ජලය ලබාදීමේදී මෙම ජලජ පැළෑටි නිසා ජලය ගලා යාමේ ප්‍රමාදයක් පවතින බවත්;

(iii) අදාළ බලධාරීන් දැනුවත් කළද මෙතෙක් විසඳුමක් නොලැබුනු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මහ කන්නයේ ගොවිතැන් සඳහා ජලය මුදා හැරීමට පෙර මෙම ජලජ පැළෑටි ඉවත් කිරීමට සැලැස්මක් සකස්කර තිබේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1150/'18

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂයේ මහ කන්නයේ වට්ටක්කා හා තක්කාලි වැනි භෝගවල අස්වැන්න අලෙවි කිරීමට නොහැකිවීම හේතුවෙන් ගොවීන්ගේ ආර්ථිකය කඩා වැටුනු බව පිළිගන්නේද;

(ii) මේ හේතුවෙන් වට්ටක්කා මිලදී ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 05 ක මුදලක් වෙන්කළ බවට පුවත්පත්වල පළ වූ වාර්තා සත්‍යයක්ද;

(iii) එසේ නම්, ඒවා මිලදී ගැනීමට හා අලෙවි කිරීමට සම්බන්ධ වූ ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත එළවළු කිලෝ එකක් මිලදී ගනු ලැබූ මිල කොපමණද;

(ii) ඒවා අලෙවි කරන ලද මිල කොපමණද;

(iii) මිලදී ගත් එළවළු ප්‍රමාණය කොපමණද;

(iv) මෙම වැඩපිළිවෙළින් රජයට සිදු වූ ලාභය හෝ අලාභය කවරේද;

(v) මෙම වැඩපිළිවෙළෙහි සාර්ථකත්වය මත එය ඉදිරි වර්ෂයේදීත් ක්‍රියාත්මක කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1173/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනෙහි ග්‍රාමීය කිරි ගොවීන්ගෙන් දෛනිකව ලබා ගන්නා එළකිරි සහ මී කිරි ලීටර් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ අතරින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් දෛනිකව ලබා ගන්නා එළකිරි සහ මී කිරි ලීටර් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මිල්කෝ ආයතනය විසින් ලබා ගන්නා කිරිවලට ගෙවීම් කරනු ලබන්නේ දින 15 කට වරක් වන නමුත්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් ලබාගෙන ඇති දියර කිරිවලට මාස දෙකකින් ගෙවීම් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ගෝමරන්කඩවල, පදවි ශ්‍රී පුර, මොරවැව, කන්තලේ, සේරුවිල, තඹලගමුව, නගර හා කඩවත්, කින්නියා, මුතූර්, වෙරුගල් හා කුච්චවෙලි යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සිටින කිරි ගොවීන් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කිරි ගොවීන්ට මිල්කෝ ආයතනය විසින් මේ වනවිට ගෙවීමට ඇති මුදල එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම මුදල් ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1169/'18

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර ජල ව්‍යාපෘතියේ 04 වැනි අදියරට අයත් ඉදිකිරීම් කටයුතු නිමවන දිනය කවරේද;

(ii) මෙම ව්‍යාපෘතිය නිම කිරීමේදී අපේක්ෂිත ජල ධාරිතාවය දැනට පවතින ජල ධාරිතා අගයට වඩා කොපමණ අගයක් ගන්නේද;

(iii) මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇති පරිදි සිදු කිරීමට ගතවන කාලය කොපමණද;

(iv) ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය නිර්දේශ කරන ඩී.අයි. ජල නල වෙනුවට වෙනත් ජී.ආර්. ජල නල වර්ගයක් එලීමට අදාළ කොන්ත්‍රාත් සමාගම උත්සාහ කරන බව දන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කඹුරුපිටිය ප්‍රදේශයට එලීමට නියමිත ජල නලයේ විශ්කම්භය කොපමණද;

(ii) එමඟින් එම ප්‍රදේශයට අවශ්‍යවන අඛණ්ඩ ජල සැපයුම සපුරාලිය හැකි වන්නේද;

(iii) ජල නල එලීමට ඇති මුළු කිලෝමීටර් ප්‍රමාණය කොපමණද;

(iv) එමඟින් දික්වැල්ල සහ කුඩාවැල්ල ප්‍රදේශ ආවරණය වන පරිදි ප්‍රමාණවත් ජල ධාරිතාවක් සපයන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1190/'18

ගරු බිමල් රත්නායක මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1276/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඉස්සන් වගා කරනු ලබන ප්‍රදේශ කවරේද;

(ii) අපනයනය කිරීම සඳහා ඉස්සන් වගා කරනු ලබන වගාකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ වාර්ෂික ඉස්සන් නිෂ්පාදනය කොපමණද;

(iv) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ ඉස්සන් වගාවෙන් ලද වාර්ෂික විදේශ විනිමය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉස්සන් වගා කිරීම සඳහා රජය ලබා දී ඇති සහන කවරේද;

(vi) ඉදිරියේ දී ඉස්සන් වගාවෙන් ලැබෙන විදේශ විනිමය වැඩි කර ගැනීම සඳහා රජය කටයුතු කරන්නේද;

(vii) එසේ නම්, ඒ සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග පැහැදිලි කරන්නේද;

(viii) වගාකරුවන් ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන පියවර පැහැදිලි කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1290/18

ගරු තාරක බාලසූරිය මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෑගල්ල අතුරු මාර්ගයේ 3 වැනි අදියර යටතේ අත්පත් කර ගත් ඉඩම් සඳහා රජය විසින් සමහර පදිංචිකරුවන්ට වන්දි මුදල් ලබා දී ඇති බවත්;

(ii) එහෙත්, එසේ පවරාගත් කෑගල්ල, බණ්ඩාරනායක මාවතේ, අංක 145හි පදිංචි බෝගහලන්ද පවුලේ අයට අයත් ඉඩම සඳහා රු.2,375,750/-ක මුදලක් ගෙවීමට, ඉඩම් අත්කර ගැනීමේ සමාලෝචන මණ්ඩලය විසින් තීන්දු කර ඇති බවත්;

(iii) කෙසේ වෙතත්, මේ වනතෙක් එම වන්දි මුදල ඔවුන්ට ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) බෝගහලන්ද පවුලේ පියා හා සොහොයුරන් මිය ගොස් ඇති අතර, ඉතිරිව ඇත්තේ එම පවුලේ කාන්තාවන් පමණක් වන බැවින්, මේ සම්බන්ධයෙන් සානුකම්පිතව සළකා බලා නීත්‍යානුකූලව ඔවුනට ලැබිය යුතු වන්දි මුදල කඩිනමින් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1297/'18

ගරු විමලවීර දිසානායක මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරට ප්‍රධාන පෙළේ පාසල් අතර වාර්ෂිකව පැවැත්වෙන ක්‍රිකට් හා වෙනත් ක්‍රීඩා තරඟවලදී බියර් සහ මත්වතුර නිපදවන සමාගම් මඟින් බියර් පානය ප්‍රවර්ධනය කිරීමට ක්‍රියා කරන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, පාසල් දරුවන්ට එයින් සිදු වන හානිය වැළැක්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1325/'18

ගරු සිසිර ජයකොඩි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශපාලන පලිගැනීම්වලට ලක්වූවන් යන පදනම මත අධ්‍යාපන සේවයේ උසස්වීම් ලබාදීමට පියවර ගෙන තිබේද;

(ii) ඉහත කරුණ මත උසස්වීම් ලබාදීමට නිර්දේශිත අධ්‍යාපන සේවයේ යෙදී සිටින්නන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iii) දේශපාලන පලිගැනීම්වලට ලක්වූවායැයි නිර්දේශ කිරීම සඳහා පත්කරන ලද කමිටුවේ සාමාජිකයන් කවුරුන්ද;

(iv) එම කමිටු සාමාජිකයන්ද දේශපාලන පලිගැනීම්වලට ලක්වූවන් යන පදනම මත උසස්වීම් සඳහා නිර්දේශ ලබා තිබේද;

(v) එසේ නම්, එම කමිටුවේ සාමාජිකයන් වෙත ලබාදීමට නිර්දේශ කර ඇති උසස්වීම් කවරේද;

(vi) එම උසස්වීම් හේතුවෙන් අධ්‍යාපන සේවය බරපතල පිරිහීමකට ලක්වන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1328/'18

ගරු එස්. ශ්‍රීතරන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, අර්ධද්වීප කලාපයේ, එලුවයිතිවු නමැති දූපතෙහි පිහිටි පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දූපතෙහි පිහිටි සරවනබවා විද්‍යාලෙහි අ.පො.ස.(සා.පෙළ) විභාගයට පෙනී සිටීමට සූදානම් ශිෂ්‍යයන් එම විද්‍යාලේ වාර විභාග සඳහා පෙනී සිටින අවසන් ශ්‍රේණිය කවරේද;

(iii) දැනට එම ශිෂ්‍යයන් අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටිනු ලබන විද්‍යාල කවරේද;

(iv) අ.පො.ස. (සා.පෙළ) විභාගය එලුවයිතිවුහි පැවැත්වීමට ඇති බාධක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1343'18

ගරු නිහාල් ගලප්පත්ති මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක කිරීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුව යටතේ පිහිටුවන ලද නිෂ්පාදන බදු අංශයෙහි සේවය කිරීම සුරාබදු පරීක්ෂකවරුන් විසින් ප්‍රතික්ෂේප කරන ලද බවත්;

(ii) එබැවින්, එම පනතේ සුරාබදු පරීක්ෂක සේවයට අයත් රාජකාරි ඉටු කිරීම සඳහා බඳවාගන්නා ලද උප පරීක්ෂකවරුන්, සුරාබදු පරීක්ෂක සේවයට උසස් කිරීම පිණිස මුදල් රෙගුලාසි 71 යටතේ සුරාබදු පරීක්ෂක තනතුරු 10 ක් ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කර ඇති බවත්;

(iii) අනුමත කළ එම තනතුරු සුරාබදු දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන බදු අංශයට අනුයුක්ත කර ඇති උප පරීක්ෂකවරුන් උසස් කිරීම මඟින් පිරවීමට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අනුමත කර ඇති බවත්;

(iv) පරීක්ෂණයක් මඟින් උසස්වීම් ලබාදී එම තනතුරු 10 පිරවීම සඳහා සහ උසස් කිරීමට අනුමත කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) නිෂ්පාදන බදු උප පරීක්ෂකවරුන් සුරා බදු පරීක්ෂක තනතුරට උසස් කර තිබේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1354/’18

ගරු ගාමිණී ලොකුගේ මහතා,— උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.15 වැනි දිනට මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවයේ යෙදී සිටි ස්ථිර, අනියම් හා කොන්ත්‍රාත් සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015.01.15 දින සිට 2018.05.15 දින දක්වා මධ්‍යම සංස්කෘතික අරමුදලට ස්ථිර, අනියම් හා කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගෙන ඇති සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම බඳවා ගැනීම් මධ්‍යම සංස්කෘතික අරමුදලේ පිරිස් පාලන සැලැස්මට අනුකූලව සිදු කර තිබේද;

(iv) ඉහත (ii)හි සඳහන් සේවකයන් වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලින් වැටුප් හා දීමනා ලෙස මාසිකව වැය කරනු ලබන මුදල කොපමණද;

(v) 2015.01.15 දින සිට 2018.05.15 දින දක්වා මධ්‍යම සංස්කෘතික අරමුදලින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ස්ථිර, අනියම් හා කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගෙන ඇති සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) ඉහත (v)හි සඳහන් සේවකයන් වෙනුවෙන් මධ්‍යම සංස්කෘතික අරමුදලින් වැටුප් හා දීමනා ලෙස මාසිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2018 නොවැම්බර් 15 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

69/’18

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 281, 282, 283 සහ 284 හි සඳහන් කර ඇති කරුණු අනුව, ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ සංවර්ධනය වෙනුවෙන් අනුගමනය කළ ප්‍රධාන ක්‍රියාමාර්ග පැහැදිලි කරන්නේද;

(ii) යෝජනා අංක 284ට අනුව, ශ්‍රී ලංකාවේ සුරැකුම් හා විනිමය කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමට අදාළව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) කොටස් වෙළෙඳපොළ සංවර්ධනය මැන බැලීම සඳහා යොදා ගන්නා සම්මත දර්ශකයන්ට අනුව, වර්ෂ 2000 සිට 2017 දක්වා, ශ්‍රී ලංකා කොටස් වෙළෙඳපොළෙහි ප්‍රගතිය පිළිබඳ උපනතීන් දැක්වෙන වගුවක් ඉදිරිපත් කරන්නේද;

(iv) වර්තමානයේදී අසාමාන්‍ය ලෙස පොළී අනුපාතිකය ඉහළ ගොස් පැවතීම, කොටස් වෙළෙඳපොළ සංවර්ධනයට බාධාවක් ලෙස සලකන්නේද;

(v) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් දරනු ලබන අදහස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

205/'18

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වසර තුළ ජනාධිපතිතුමා සහභාගී වූ විදේශ සංචාර කවරේද;

(ii) එකී එක් එක් විදේශ සංචාරයට සහභාගී වූ පුද්ගලයන්ගේ නම්, තනතුරු සහ එම පුද්ගලයන් වෙනුවෙන් රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන විසින් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

275/'18

ගරු හේෂා විතානගේ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බලශක්තිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය නියමිත පරිදි පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති බව පිළිගන්නේද;

(ii) එම ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වූයේ මන්ද;

(iii) කෙසේ වෙතත්, ඉදිරියේදී හෝ බලශක්ති පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

755/'18

ගරු වමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වියළුව මැතිවරණ කොට්ඨාසයේ, මීගහකිවුල අධ්‍යාපන කොට්ඨාසය තුළ බ/කරඳගහමඩ විද්‍යාලය නමින් පාසලක් තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව සහ ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ස්ථිර ක්‍රීඩා පිටියක් නොමැති වීම නිසා, පසුගියදා එම පාසලේ ක්‍රීඩා උත්සවය අසළ පිහිටි මාර්ගයක පැවැත්වූ බව දන්නේද;

(iv) දුෂ්කර පළාතක පිහිටි මෙම පාසලේ අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1123/'18

ගරු කනක හේරත් මහතා,— රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පකිස්ථාන ජාත්‍යන්තර ගුවන් සමාගමකට කල්බදු ක්‍රමය (Wet lease) යටතේ ගුවන් යානයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම ගුවන් යානය පැයකට කල් බදු ලබා දී ඇති මුදල කොපමණද;

(iii) මෙම ගිවිසුම් ගතවීම කොපමණ කාලයක් සඳහා වලංගු වන්නේද;

(iv) ඒ සඳහා මෙතෙක් අයවිය යුතු මුළු මුදල ලැබී තිබේද;

(v) නොඑසේ නම්, ලැබී ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කල්බදු ක්‍රමය යටතේ තවත් ගුවන් යානා සඳහා ගිවිසුම් ගත වී තිබේද;

(ii) නොඑසේ නම්, ගිවිසුම් ගතවීමට සූදානම්ව සිටින්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1291/'18

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂිකර්ම අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන රාජගිරිය අංක 288 හි පිහිටි ඩී. පී. ජේ. ටවර් ගොඩනැගිල්ල කුලියට/බද්දට ලබා ගත් ගිවිසුමේ පිටපතක් ලබා දෙන්නේද;

(ii) එම ගිවිසුමට අනුව එහි මාසික කුලිය, කුලී/බදු කාල සීමාව ආරම්භ වූ දිනය සහ එම කාලය අවසන් වන දිනය කවරේද;

(iii) ගොඩනැගිල්ල කුලියට/බද්දට ගෙන පරිහරණය නොකර සිටින ලද කාලය කොපමණද;

(iv) එම කාලය සඳහා ගෙවීම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එකී ගොඩනැගිල්ල ලබා ගැනීමේදී විධිමත් ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කර තිබේ නම්, ඒ සඳහා ඉදිරිපත්ව තිබූ මිල ගණන් කවරේද;

(ii) ගොඩනැගිල්ල කුලියට ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමතියක් ලැබී තිබේ නම්, එහි පිටපතක් ලබා දෙන්නේද;

(iii) අමාත්‍යාංශය කලින් පවත්වාගෙන යන ලද "ගොවිජන මන්දිරය" නැවත ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තුවෙන් කරන ලද ඉල්ලීමට ලැබුණු ප්‍රතිචාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1277/'18

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ රෝහල්වල සේවය කරන හෙද නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) හෙද නිලධාරී පුරප්පාඩු ඇති රෝහල් කවරේද;

(iii) මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම පුරප්පාඩු ඇති වීමට හේතු කවරේද;

(v) රෝහල්වල පවතින හෙද නිලධාරී පුරප්පාඩු හේතුවෙන් රෝගීන් පත් වන අපහසුතා අවම කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීමට මේ වනවිට ගැසට් නිවේදන නිකුත් කර තිබේද;

(ii) හෙද නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් කවරේද;

(iii) මේ වනවිට පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කර නොමැති නම්, එම පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1295/18

ගරු තාරක බාලසූරිය මහතා,— පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුරප්පාඩුව පවතින මාවනැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් ධූරයට එහි කලින් සේවය කර දූෂණ චෝදනාවලට ලක් වූ එම්. පද්මිණී සෙනෙහෙලතා මහත්මිය පත් කළ බවත්;

(ii) ඇයට විරුද්ධව පළාත් ආණ්ඩුකාරවරියට කරන ලද පැමිණිල්ලක් මත සිදු කළ පරීක්ෂණයකින් පසු, ඇය සේවයෙන් ඉවත් කර ඒ වෙනුවට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එම තනතුර සඳහා වැඩ බැලීමේ පදනම මත තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති ඩබ්.ඩී.කේ. ඒකනායක මහතා පත් කර ඇති බවත්;

(iii) ප්‍රාදේශීය සභාවේ වත්මන් සභාපතිවරයා විසින් ඒකනායක මහතාට ප්‍රාදේශීය සභා ලේකම් ධූරයේ රාජකාරී කටයුතු කිරීමට ඉඩ නොදෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එබැවින් සභාපතිවරයාගේ මෙම නීතිවිරෝධී සහ සදාචාරවත් නොවන ක්‍රියාදාමය සම්බන්ධයෙන් සබරගමුව පළාත් ආණ්ඩුකාරවරිය දැනුවත් කර සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?